# ලංසු කැඳවීමේ ආරාධනය.

## බළන්ගොඩ නගර සභාව

පහත සදහන් ඉදිකිරීම සදහා බලන්ගොඩ නගර සභාවේ සභාපති විසින් 2008 සැප්තැම්බර් 19 වැනි දින පෙ.ව.10.00 දක්වා ලංසුකරුවන්ගේ මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. ගොඩනැගිලි අළුත්වැඩියාව,පුනරුත්ථාපනය හා ඉදිකිරීමෙන් පසු මාස 06 ක් දක්වා නඩත්තු කටයුතු ඉටුකිරීම ද කොන්ත්‍රාත්කරුට පැවරෙනු ඇත.

| අනු අංකය | විෂය අංකය | වැඩ විෂය | ලියාපදිංචි වටිනාකම | ආපසු නොගෙවන ටෙන්ඩර් තැන්පත් |
|---|---|---|---|---|
| 01 | බනස/ක/3/72/02/08 | බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කසල කළමණාකරණ කටයුතු සදහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ පොළොව කොන්ක්‍රීට් කිරීම iv අධියර | M-6 | රු.2000/- |

02. ඉදිකිරීම් කර්මාන්ත පුහුණු හා සංවර්ධන ආයතනයේ ගොඩනැගිලි විෂය යටතේ ඉහත සදහන් වටිනාකමට හෝ ඊට වැඩි වටිනාකමට ලියාපදිංචි වු කොන්ත්‍රාත්කරුවන් ලංසු අයදුම් කිරීමට සුදුස්සෝ වෙති.

03. M-6 හෝ ඊට ඉහල ශ්‍රේණියක ලියාපදිංචියක් සහිත ඉදිකිරීම් කර්මාන්ත පුහුණු හා සංවර්ධන ආයතනයේ ලියාපදිංචිය ද, ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ වලංගු සාමාජිකත්වය ද අනිවාර්යය වේ.

04. පසුගිය දෙවසර තුළ ඉදිකිරීම් කොන්ත්‍රාත්වල අසතුටුදායක හා අසාර්ථක ප්‍රගතියක් පෙන් වු කොන්ත්‍රාත්කරුවන්ට ලංසු ලේඛන නිකුත් කරනු නොලැබේ.

05. 2008 සැප්තැම්බර් 11 වැනි දින සිට 2008.සැප්තැම්බර් 18 දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව.9.00 සිට ප.ව.3.30 දක්වා ඉහත සදහන් පරිදි ගාස්තු ගෙවීමෙන් බලන්ගොඩ නගර සභාවෙන් ලංසු ලේඛණ ලබාගත හැකිය.

06. ලංසු ලේඛණ ලබාගැනීමට පෙර ඒ සදහා පිළියෙල කර ඇති මුද්‍රිත ආකෘති පත්‍රය භාවිතා කර එම ආකෘති පත්‍රයේ සදහන් කර ඇති තමා භාරයේ දැනට ඇති සියළු ඉදිකිරීම් අළුත්වැඩියා කොන්ත්‍රාත් පිළිබඳ ස්වයං ප්‍රකාශය ඉතා නිවැරදිව සම්පුර්ණ කර භාරදිය යුතුය. එම ප්‍රකාශයේ අසත්‍ය තොරතුරු අඩංගුවීම හෝ සත්‍ය තොරතුරු හෙළිදරව් නොකිරීම ඔබගේ ලංසු ප්‍රතික්ෂේප වීමට මුළික හේතුවක් වේ.

07. සියළුම ලංසුකරුවන් ප්‍රසම්පාදන කොන්දේසි වලට අනුකූලව ලංසු සුරක්ෂණයක්/තැන්පත් මුදලක් වෙනුවෙන් ලබාගත් ලියවිලි සෙසු ප්‍රසම්පාදන ලියවිලි සමඟ ඉදිරිපත් කල යුතුය. එසේම,සම්පූර්ණ කරන ලද ලංසු පත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත යනුවෙන් සදහන් කර වෙන වෙනම කවරවල බහා එම කවර දෙකම එක් කවරයක බහා කවරයේ ඉහල වම් කෙළවරේ " බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතියේ කසල කළමණාකරණ කටයුතු සදහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ පොළොව කොන්ක්‍රීට් කිරීම iv අධියර " යනුවෙන් සදහන් කර සීල් තබන ලද ලියුම් කවරය , ගරු සභාපති,බලන්ගොඩ නගර සභාව,බලන්ගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත අතින් ගෙනවිත් බහාලීමෙන් හෝ 2008.09.19 දින පෙ.ව.10.00 ට පෙර ඉදිරිපත් කල හැකිය.

08. කර්මාන්තය පිළිබඳ විස්තර බලන්ගොඩ නගර සභාවේ සැලසුම් අංශය වෙතින් කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැකිය.

09. සාර්ථක ලංසුකරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීම ඔවුන්ගේ ලියාපදිංචි වටිනාකමට සීමාකෙරෙනු ඇත. ලංසු සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

10. 2008 සැප්තැම්බර් 19 වෙනි දින පෙ.ව.10.30 ට බළන්ගොඩ නගර සභාවේ දී ලංසු විවෘත කරනු ලබනු ඇත. ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරුවන් හෝ ඔහුන්ගේ නියෝජිතයෙකුට සහභාගීවිය හැක.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.

2008-09-10 වන දින
බළන්ගොඩ නගර සභාවේ දී ය.
දුරකථන අංකය : 045 - 2287275
URL : http://www.balangoda.uc.gov.lk
Blog : http://ucbalangoda.wordpress.com